# කෝට්ටගල කැඩුම් බිඳුම් වෙදකමෙහි විශේෂත්වය

පාරම්පරික වෛද්‍ය ඩී. එම්. ස්වර්ණකුමාරි දිසානායක
පාරම්පරික වෛද්‍ය එච්. එම්. හීන්බණ්ඩා

මොණරාගල දිස්ත්‍රික්කයෙහි මඩුල්ල කොට්ඨාසයේ දඹගල්ල ප්‍රදේශයෙහි සුප්‍රකට කෝට්ටගල වෛද්‍ය පරපුර ඊට ම ආවේණික වූ චිකිත්සා පද්ධතියකට උරුමකම් කියයි. ජ්‍යොතිෂ විද්‍යාව සහ යන්ත්‍ර මන්ත්‍ර ගුරුකම් සිය චිකිත්සාව සමඟ බද්ධ කරගනිමින් සුවහසක් රෝගීන් සුවපත් කරන මෙම පරපුරෙහි මූලාරම්භක වෙදදුරු ඩී. එම්. මුදලිහාමි වෙදමහතා වේ. රෝග සඳහා ප්‍රතිකාර කිරීමේ දී මෙම පරපුර සතු සුවිශේෂතා පහත පරිදි වේ.

**තුන්දොස් කැපීම**

රෝගී වූ මුල් අවස්ථාවේ දී ම රෝගියා පැමිණියහොත් ප්‍රතිකාරය පහසු ය. නමුත් කල්ගත වී පැමිණෙන රෝගීන්ගේ 'තුන්දොස් බැඳීම' සිදු වේ. අත්දුටු ප්‍රතිකාර කළ ද ප්‍රතිඵල නොලද හොත් තුන්දොස් බැඳී ඇති බව නිශ්චය කළ හැකිය. එම අවස්ථාවෙහි දී දෙහි කැපීම සිදු කරයි. මෙහි දී දුම් ඇල්ලීම සඳහා මතුරන ලද පස්තෙල්, බෙහෙත් දර වලින් ලබාගත් අඟුරු භාවිත කරයි. අනතුරුව ආරක්ෂක කහ නූලක් ගෙලට දමනු ලබයි. තුන්දොස් බැඳීමට අමතරව 'විෂ බන්දා' තිබුණහොත් තුන්දොස් කැපීම ප්‍රමාණවත් නොවේ. එහි දී අදාළ බලවේගය හඳුනාගෙන ඊට උචිත ප්‍රතිකාර කළ යුතුය.

**පිටත් නැකැත් භාවිතය (ඇතුළත් - පිටත් සිද්ධාන්තය)**

ඉහත පරිදි තුන්දොස් කැපීමට මෙන් ම වෙනත් ඖෂධ යෝග යෙදීමේ දී ජ්‍යොතිෂ විද්‍යානුකූල ව 'පිටත්' නැකැත් භාවිතය මෙම පරපුරෙහි තවත් සුවිශේෂීතාවකි. ශරීරයෙන් ඉවතට දෝෂ පිටත් කිරීමට, ඖෂධ යොදා රෝගය දුරු කරවා ගැනීම මෙන් ම නිවසෙන් යමක් බැහැර කිරීමේ දී ද මෙම පිටත් නැකත් භාවිත කරයි. එසේ ම අණවින කොඩිවින වැනි දෝෂ ශරීරයට ඇතුළු කිරීමට මෙන් ම නිවස තුළට යමක් ගැනීමේ දී ද ඇතුළත් නැකැත් භාවිත කරයි.

| | |
|---|---|
| රේවති අස්විද බෙරණය | පිටතා |
| පුනවස පුස අස්ලිස යන | නැකතා |
| සිතසා එවිසා යන මේ | පිටතා |
| අනුපුටුප බජනෙක් සුවණේ | පිටතා |

මෙම කවියේ සඳහන් පරිදි පිටත් නැකැත් දැක්විය හැකි අතර මෙම නැකැත් පමණක් චිකිත්සාවට භාවිත කරන අතර වෙනත් කිසි ඇතුළත් නැකතක් චිකිත්සාවට භාවිත නොකරයි. මෙලෙස ඖෂධ නෙළා ගැනීමේදී ද, ඖෂධ යෙදීමේදී ද ඒ සඳහා සුදුසු නැකත, ශුද්ධි වේලාව සහ දින යොදා ගැනීම විශේෂ ලක්ෂණයකි.

**වේදනාව අඩුකිරීම සහ ඉදිරි ක්‍රියා පිළිවෙත**

වේදනාව අඩුකිරීම සඳහා මන්ත්‍ර ශාස්ත්‍ර යොදා ගනී. ජීවම් කරන ලද තෙල් ගා පිරිමැද ඊට උඩින් පිරිසිදු සුදු කපු රෙදි කැබැල්ලක් එලා පතුරු තබා නිශ්චල කිරීම සිදු කරයි. අනතුරුව කෂාය බෙහෙත් යොදනු ලැබේ. කුණු ලේ විසිරීම සඳහා මැල්ලුම් බැඳීම සහ කෂාය නියම කිරීම ඉන් අනතුරුව සිදු කරන අතර පසුව සන්ධි කරන ඖෂධ ලෙස තෙල්, මැල්ලුම් සහ පත්තු සුදුසු පරිදි භාවිත කරයි.

### තෙල් සිඳ ගැනීමේ ක්‍රමය

ඖෂධ තෙළා ගැනීමේ සිට තෙල සාදා නිමකර ගබඩා කිරීම දක්වා ම මන්ත්‍ර ශාස්ත්‍රය භාවිත කිරීම සුවිශේෂීතාවකි. ඒ ඒ තෙල් වර්ගය හිඳීම සඳහා ඊට අදාළ දර වර්ගය පමණක් භාවිත කළ යුතුය. මහා හන්දි තෙල සිඳීමේ දී සේරු හෝ මිල්ල දර භාවිත කිරීම උදාහරණ ලෙස දැක්විය හැක. තෙල බුබුළු දමා උතුරන විට ආරක්ෂක මන්ත්‍රයකින් ආරක්ෂා කළ යුතුය. මෙම අවස්ථාවේ දී තෙලෙහි සුවඳ පැතිරීම සිදුවේ. එවිට නොයෙක් 'දිෂ්ඨී' වැටීම (භූත බලවේග) ඇති වේ. මෙහි දී තෙල තනි කිරීම සිදු නොකළ යුතු අතර තෙල සිඳින පුද්ගලයා ද තනි නොවිය යුතුය. තෙල් සිඳීම සඳහා කිළිවලින් තොර පුද්ගලයන් සහභාගි කර ගත යුතු අතර යකඩ ඇණ කිහිපයක් මතුරා කම්බියකින් මුට්ටිය වටේ ගැට ගැසීම හෝ තෙල්වලට ස්පර්ශ වන පරිදි එල්ලීම මගින් තෙල ආරක්ෂා කර ගැනීම සිදු කරයි. තෙල භාජනවලට දැමීමට ප්‍රථම 1008 වරක් ජීවම් මන්ත්‍රයෙන් ජීවම් කර වී ගොඩක් යට හෝ ගෙදරින් පිටත ගස් බෙනයක තැබිය යුතුය. ඖෂධ තෙළා ගැනීමේ දී සූර්යයා මුහුණ පා ඇති දිශාවට අනුව ගංගා සහ මහ වනයෙන් කඩා ගත යුතුය. බෙහෙත් කැපීම් කෙටීම් ද ශුභ වේලාවකට අනුව ම සිදු කරනු ලැබේ. වට තිර ඇද උඩුවියන් බැඳ නා අතු, බුලත්, පුවක් මල් එල්ලූ ගොම මැටි ගා පිරිසිදු කරගත් ලිපේ කුකුළු හඬක් අල්ලා ඖෂධ ලිප තැබිය යුතුය.

### දිෂ්ඨීය හඳුනාගැනීම

බරපතල අනතුරක දී (උදා- ගසකින් වැටීමක දී) හෝ තුන්දොස් කැපීමෙන් ප්‍රතිඵල නොලබා විෂ බන්දා ඇති අවස්ථාවක දී අදාළ දිෂ්ඨීය (බලවේගය) හඳුනා ගැනීමට විශේෂිත ක්‍රමයක් භාවිත කරයි. මූලික වශයෙන් බිය දුරු කිරීම සඳහා නූලක් ජීවම් කර ගෙලට දමනු ලබයි. ගසකින් වැටුණු රෝගියෙකුට නම් මහසෝනාගේ දිෂ්ඨීය ද අමතර ව වෙනත් දිෂ්ඨී ද බලපායි. එවිට මහසෝනාගේ පිරිවර හෝ තුන්දෙනාගේ පාළිය, පස්දෙනාගේ පාළිය මඟින් නූලක් ජීවම් කර ගෙලට දමයි. මෙසේ භාවිත වන පාළි වර්ග ලෙස ඉරමුදුන් පාළිය, සඳමුදුන් පාළිය, ගිනියම් පාළිය, රීරියකුන් පාළිය හා කඩවර පාළිය දැක්විය හැකිය. මෙවැනි පාළි 18ක් පවතින අතර ඒ ඒ පාළියට ආරක්ෂක මන්ත්‍ර ඒ ඒ වේලාව අනුව භාවිත කරයි.
අදාළ දිෂ්ඨීය හඳුනාගැනීම සඳහා පහත උපක්‍රමය භාවිත කරයි. බුලත් කොළයක් බිම තබා ඒ මත පඬුරක් තබා හඳුන් කිරිපැන් වලින් සෝදාගත් පොල්ගෙඩියක් ඒ මත තබයි. මෙහි දී කහ දියර, උරච්චි කරගත් සුදුහඳුන්, පොල්කිරි සහ දෙහියුෂ ස්වල්පයක් මිශ්‍රකර හඳුන් කිරිපැන් සාදාගනී. හඳුනා ගැනීමට භාජනය කරනු ලබන දිෂ්ඨීවල නාමයන්, විෂ බන්දා ඇති පුද්ගලයන් ආදී සැක සහිත නම් ලියන ලද තුණ්ඩු පොල්ගෙඩිය වටා තබනු ලැබේ. සුදුසු ගුණ පිහිටි පුද්ගලයෙකු පොල්ගෙඩිය මත වාඩි වී (බිම ස්පර්ශ නොවන පරිදි) හෝ වහලේ එල්ලන ලද ලණුවක ආධාරයෙන් පොල් ගෙඩිය මත සිටගෙන සිටින විට පොල් ගෙඩියේ මුඩ්ඩ අදාළ නාමය දෙසට කරකැවී නතර වීම සිදුවේ. මෙහි දී අදාළ මන්ත්‍රය මඟින් ජීවම් කළ යුතුය. මෙලෙස හඳුනාගත් දිෂ්ඨී ලෙස මහසොහොන් යකා, රීරි යකා, කළුකුමාරයා, තොටයකා හා මරුයකා දැක්විය හැක.

### අනෙකුත් මන්ත්‍ර ක්‍රම

භග්න සන්ධානය සඳහා මතුරන ලද බෙහෙත් පටි, සතුන්ගේ ඇට, බෙහෙත් ලණු, බෙහෙත් කෝටු භාවිත කරයි. එක් එක් ස්ථානයට අනුව සතුන්ගේ නම් වෙනස් වේ. බෙහෙත් කෝටුව මතුරා තබා වෙන් වූ ඇට සවි කිරීම සුවිශේෂී වේ. බෙහෙත් බැඳීමට අපහසු අවස්ථාවල දී, අපහසු ස්ථානවල දී, කෙම් ක්‍රම භාවිත කරයි. කුකුන්දර අස්ථි භග්නයක දී සත්ත්ව ඇට කැබැල්ලක් ඉණේ ගැට ගැසීම, ඇතැම් විට ඇද කකුලේ හෝ බෙල්ලේ බැඳීම කෙම් ක්‍රම සඳහා උදාහරණ වේ.

**රෝගියා නැහැවීම**

ප්‍රතිකාර අවසානයේ රෝගියා නැවීමේ දී නික, පාවට්ටා, තෙල් එරඬු, දෙහි, කොහොඹ යනාදී කොළ තම්බා ගත් ජලය භාවිත කරයි. මෙම ජලයට මතුරන ලද ජලය ස්වල්පයක් ද එක් කරයි. එය සකසා ගැනීම පහත පරිදි වේ. කුකුළු හඬක් ඇසීමට පෙර (බ්‍රහ්ම මුහුර්තයෙන්) වතුර කළයක් ගෙන පේ කර ගත යුතුය. පිටත් නැකතකින් මෙම වතුර කළය ගෙන එයට කහ, අබ, කපු ඇට, ලුණු කැට, බටහිර දිශාවට ගිය කොළ හතක් සහිත දෙහි අත්තක් යන මේවා දමා වතුර මතුරන මන්ත්‍රයෙන් ජීවම් කර මෙම ජලය ස්වල්පයක් නෑමට ගන්නා ඔසු දියට මිශ්‍ර කර නෑමට දෙයි. රෝගියාගේ තුන්දොස් බැඳී ඇත්නම් දිනක් ඇතුළත වතුර ගඳ ගසයි. නිලමැස්සන් පවා ඇදී එයි. නැතහොත් සතියක් පමණ සාමාන්‍ය පරිදි තබාගෙන භාවිත කළ හැකිය. එසේ වතුර ගඳ ගැසුව ද නාන ජලයට මිශ්‍ර කිරීමෙන් තුන්දොස් බැහැර වීම පහසු කරවයි.